ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

Article 12(1)

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2017-2-27 |

පැමිණිලිකාරිය : රූපිකා ජයරංජනී ජයසිංහ මිය
නො: 4/A, කොළමුන්න පාර,
හැඩිගම, පිළියන්දල.

වගඋත්තරකරුවන් : 01. ලේකම්,
නගර සභාව,
කැස්බෑව.

02. සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

පැමිණිලි අංක : **HRC/912/14/I-23**

පැමිණිල්ලේ කරුණු දැක්වීම:-

පැමිණිලිකරු කැස්බෑව නගර සභාවට 2013.05.08 දින සිට තම නිවස ආසන්නයේ නිවැසියෙකු විසින් සිදුකරනු ලබන අනවසර ඉදිකිරීම් පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කළද, එම පැමිණිලි පිළිබඳව කිසිදු පියවරක් අදාළ වගඋත්තර පාර්ශවයන් විසින් නොගත් බවට මෙම පැමිණිල්ලෙන් දක්වා ඇත.

පළවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

මෙම පැමිණිලිකාරියට යාබද ඉඩමේ හිමිකරු වන වී.එම්.පී. ගොඩමුල්ල යන අයගෙන් සිදුවන පීඩාවන් හා අනවසර ඉදිකිරීම පිළිබඳව පැමිණිල්ලක් ඉදිරිපත් වූ බවත්, එම පීඩාවන් මැඩ

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 165, කින්සි පාර, කොළඹ - 08.<br>165, கின்சி வீதி, கொழும்பு - 08.<br>165, Kynsey Road, Colombo - 08. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011-2696470 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2696470 |
| ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@sltnet.lk | | | | |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2689558 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 011-2689558, 1996 |
| වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk | | | | |

පැවැත්වීම සඳහා ඉදිකිරීම් සිදු කරන පාර්ශවයට 2013.05.08 දින අනවසර ඉදිකිරීම් නවතන ලෙසත් පැමිණිලිකාරියට සිදුවන පීඩාවන් වලක්වාලීම සඳහා ගතයුතු පියවර ගන්නා ලෙස දැන්වූ බවත් සඳහන් කර ඇත. තවද 2014.01.17 දින අනවසර ඉදිකිරීම පිළිබඳව ඉදිකිරීම් සිදු කරන පාර්ශවය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 1980 දී මෙම ගොඩනැගිල්ලට අනුමැතියක් මුල් අයිතිකරු ලබාගෙන ඇති බවත්. 2014.08.11 දින මෙම ඉඩම මිලදී ගැනීමේදී සැලසුම ලබා දී නොමැති බවත්. 2009.03.23 වන දින බිම් කට්ටි අනුමැතියකින් තොරව නිවසක් සාදා ගැනීම සඳහා අනුමැතිය අදාල පාර්ශවයට ලබා දුන් බවත්. 2014.05.30 දින B1/BA/14/2009 ගොනුව යටතේ පවතින ගොඩනැගිල්ල සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇති බවත්. සැලසුම් කමිටුව මගින් අඩුපාඩු දන්වා යවා ඇති නමුත්. අඩුපාඩු සකසා මේ වනතුරු සංශෝධිත සැලසුම් ඉදිරිපත් කර නොමැති බවත් සඳහන් කර ඇත.

2015.06.18 දින මෙම පැමිණිලිකාරිය විසින් නැවතත් අනවසර ඉදිකිරීමක් කරන බව වාර්තා කිරීම නිසා ඒ පිළිබඳව ස්ථානීය පරීක්ෂාවක් කළ තාක්ෂණ නිලධාරී විසින් අනවසර පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවත්. 2015.07.03 දින අනවසර ඉදිකිරීමක් කරනු ලබන බවට චෝදනා ලැබ ඇති පාර්ශවය ලිපියක් ඉදිරිපත් කරමින් ඒ. පී. ජයසිංහ මහත්මියට සිදු වී යැයි කියන ගැටළුවලට විසඳුම් ලබාදී ඇති බව දන්වා ඇති අතර අනවසර ඉදිකිරීම් කළ පාර්ශවයේ නිවස සම්පූර්ණයෙන් කඩා ඉවත් කිරීම කළයුතු බවත්. අනුමත කළහැකි කොටස් සේවා ගාස්තු අයකර අනුමත කර ගතහැකි බවත් තවදුරටත් දක්වා ඇත.

දෙවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

දෙවන වගඋත්තර පාර්ශවය පැමිණිල්ලට අදාලව කරුණු ඉදිරිපත් කරමින් පැමිණිලිකාරිය දක්වන නිවස අදාල සැලසුම් අනුමැතියකින් තොරව සිදු කර ඇති අතර සිදුකර ඇති ඉදිකිරීම නාගරික සංවර්ධන අධිකාරියේ ගොඩනැගිලි සැලසුම් හා රෙගුලාසිවලට පටහැනිව සිදු කර ඇති බවත්. උක්ත අනවසර ඉදිකිරීම සම්බන්ධව අවස්ථා කීපයකදී සංවර්ධනකරුට දැනුම් දී ඇති බවට කරුණු අනාවරණය වූ හෙයින්. මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවරක් ගැනීමට නාගරික සංවර්ධන අධිකාරියේ නීති අංශය වෙත යොමු කිරීමට කටයුතු කළ බවත් දක්වා ඇත.

නිරීක්ෂණ හා නිගමනය :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ලට අනුව සඳහන් කර ඇත්තේ තමාට නීතියේ රැකවරණය සර්වසාධාරණව ලැබී නැති බවයි. එනම් අනවසර ඉදිකිරීම් සම්බන්ධව වගඋත්තර පාර්ශවයට පැමිණිලි කළද අදාල පැමිණිලි පිළිබඳ නිසි ක්‍රියාමාර්ග ගෙන නොමැති බවයි.

ඒ අනුව පහත කරුණු නිරීක්ෂණය වී ඇත.

පැමිණිලිකාරිය තම නිවසට යාබද නිවැසියා විසින් සිදු කරනු ලබන අනවසර ඉදිකිරීම් පිළිබඳව 2013 වර්ෂයේ සිට පැමිණිලි කර ඇති අතර. එම පැමිණිලි සම්බන්ධව 2013.10.10 දින 1987 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට අවසාන නිවේදනය අනවසර ඉදිකිරීම් කළ පාර්ශවයට ලබා දී ඇති බවත්. එම ඉදිකිරීම් නගර සභාවේ සැලසුම් අනුමැතියකින් තොරව සිදු කරන බව වගඋත්තර පාර්ශවය විසින් 2015.06.18 සිදු කළ ස්ථානීය පරීක්ෂාවෙන්ද තහවුරු කොට ගෙන තිබූ බවත් නිරීක්ෂණය විඇත.

මෙම පැමිණිල්ලට අදාළව වගඋත්තර පාර්ශවය විසින් පනත ප්‍රකාරව නිසි ක්‍රියාමාර්ග නොගැනීම නිසා අදාළ අනවසර ඉදිකිරීම් දිගින් දිගටම සිදු වී ඇති බවත්. 2015.09.16 දින පැමිණිලිකාරියගේ පැමිණිල්ලට අදාළව ඉදිරි නීතිමය කටයුතු කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ බලාත්මක අංශය වෙත මුල් ගොනුව යවා ඇති බවත්. නැවත 2016.03.16 දිනැතිව නිවැරදි පරීක්ෂණ වාර්තාවක් සමග නීතිමය කටයුතු සඳහා බලාත්මක අංශය වෙත යොමු කර ඇති බවත්. ඒ අනුව පැමිණිලිකාරිය විසින් 2013 වර්ෂයේ යොමු කළ අනවසර ඉදිකිරීමක් පිළිබඳ වූ පැමිණිල්ල මේ දක්වා නගර සභාව විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත් නිරීක්ෂණය වී ඇත. එසේම. නාගරික සංවර්ධන අධිකාරියද අදාළ පැමිණිල්ල සම්බන්ධව පනත ප්‍රකාරව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වී ඇත.

මෙහි ඉදිරිපත්ව ඇති සමස්ථ කරුණු අනුව අනවසර ඉදිකිරීම් පාර්ශවය එම ඉදිකිරීම් සිදු කිරීමේදී සැලසුම් අනුමත කරගැනීමට කාලවේලාවක් ලබාදීම තුළින් හා අලසව කටයුතු කිරීම තුළින් දිගින් දිගටම අනවසර ඉදිකිරීම් කර ඇති බවත්. ඒ පිළිබඳ මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරී පනතේ 28 අ (3) වගන්තිය යටතේ කටයුතු නොකිරීම තුළින් පැමිණිලිකාරියගේ පැමිණිල්ල සම්බන්ධව නිසි ලෙස කටයුතු කර නොමැති බවත් කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලබන අතර එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංගනය වී ඇති බවට කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලබයි.

නිගමනය :-

ඒ අනුව 2017.03.27 දිනට පෙර මෙම අනවසර ඉදිකිරීම සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරී පනත ප්‍රකාරව ක්‍රියාත්මක වී නිසි පියවර ගැනීමට කටයුතු කළයුතුය.

2018.03.27 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.